# "බයිලා බීට්ස් 3"

උපන් පරිසරයෙන් වෙන්ව වෙනම ම පරිසරයක පදිංචියට ආ අපගේ මතු පරපුර කොයි මඟකට යොමු වේදැයි සිතනා විට ඇතිවන්නේ චකිතයකි. වෘත්තියෙන්, ගුණධර්ම අතින්, සමාජ සම්බන්ධතා අනුව ඔවුන් කවුරුන් වේ ද යන්න සිතා ගත නොහැකියි. ඒ අතරින් ගුණධර්ම මුල් විය යුතු යැයි හැඟෙයි.

උපන් බිමෙන් අප මෙහි පැමිණිය ද බොහෝ විට අප දරුවන් මෙහි ඉපදුණා වුන් වෙයි. එහෙත් අප උපන් බිමේ අපේ දේ පිළිබඳව ආශක්තව ඒ සඳහා ගුණාත්මක සිතුවිලි වලින් යුතුව යොමු වීමේ ප්‍රවණතාවය අපගේ යොවුන් දරුවන්ගෙන් දක්නට ලැබීම සතුටට කාරණයකි. එවන් සද්කාර්යයකට යොමු වූ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් පිරිසකගේ උත්සාහය පිළිබඳවයි, මේ විමසුම.

"අපේ මේ අංගය අපි සංවිධානය කරන්නේ තුන් වෙනි වතාවට." ගිහාන් ජයවීර යෞවනවා අප හා එක් වූයේ "බයිලා බීට්ස් 3" (BAILA BEATS 3* රාත්‍රී බෝජන ආලිංගන නර්තන සාදය පිළිබඳව කතා කිරීමටයි.

"පහුගිය අවුරුදු වල එක රාත්‍රියකින් ඩොලර් 9,000ක් විතර ඉතිරි කරලා ලංකාවේ මහරගම පිළිකා රෝහලට උපකාර කළා. ඒ මෙල්බර්න්වල තියෙන සී.සී.සී. (C.C.C) සංවිධානය මාර්ගයෙන්. ඉතින් මේ වතාවෙත් අපි ඩොලර් 10,000ක් විතර ඉතිරි කරගෙන ලංකාවේ ආයතන දෙකකට උදව් කරන්න බලාපොරොත්තු වෙනවා."

"පළවෙනි ආයතනය තමයි මහරගම පිළිකා රෝහලේ රෝගීන් වෙනුවෙන් සී.සී.සී. සංවිධානය ඉදිකර ඇති රෝගී නේවාසිකාගාරය (Transit Home) දුර පළාත්වලින් එන පිළිකා රෝගීන්ට ප්‍රතිකාරවලින් පස්සෙත් නැවතිලා ඉන්න වෙනවා. ඉතින් ඒ අයට නොමිළයේ නේවාසික පහසුකම් සපයන්න ඉදිකරපු මේ නේවාසිකාගාරයේ නඩත්තුවට මුදල් අවශ්‍ය වෙනවා. ඒ වෙනුවෙන් අපි ඩොලර් 5,000ක් පමණ පරිත්‍යාග කරන්න බලාපොරොත්තු වෙනවා."

"ඇත්තට ම මේ රෝහලේ ඇඳන් 188ක් තියෙනවා. රෝගියා එක්ක තව කෙනෙකුටත් නවතින්න පහසුකම් තියෙනවා. ඉතින් මේ නඩත්තු කටයුතුවලට අවුරුද්දකට ඩොලර් 100,000 විතර වියදම් වෙනවා.

"ඒ වගේම මේ රෝගීන් බොහෝ දෙනක් මානසික ආතතියෙනුයි ඉන්නෙ. ඉතින් ඒ අයගේ මානසික තත්වය නඟාසිටුවන එක වැදගත්. ඒකට අවශ්‍ය උපදේශන සේවා කරන්න විශේෂ දුරකථන පහසුකම් ලබා දීලා තියෙනවා සී.සී.සී. සංවිධානයෙන්. මේ " සී.සී.සී. හොට් ලයින් " අංකය 1333 (ශ්‍රී ලංකාව). ඉතින් ඒ වෙනුවෙනුත් අපේ ඒ මුදල් යොදාගන්නවා. මේ ගැන විස්තර cccfoundation.org.au වෙබ් අඩවියට ගිහින් බලන්න පුළුවන්. ඒ වගේම :03* 93301085 කතා කරලා තොරතුරු දැනගන්න පුළුවන්."

"අනිත් මුදල් අපි පරිත්‍යාග කරන්නේ කෑගල්ල මිරිහැල්ල ප්‍රදේශයේ තියෙන "මිෂන් හවුස්" එකේ අනාථ ළමා නිවාසයට. ඒ පළාතේ අය මේ තැනට කියන්නේ "ගල් පල්ලිය" කියලා. ඉතින් ඒ අයට මෙතෙක් ලැබුණ ආධාර නැවතිලා බොහොම අපහසුවෙන් තමයි කරගෙන යන්නෙ. දැනට එතන අනාථ ළමයි 29 දෙනෙක් ඉන්නවා....."

මේ පිළිබඳව වැඩි දුරටත් අදහස් දැක්වීමට ගුන්‍යා ජයකොඩි යෞවනිය එක් වූවාය.

"ඇත්තටම අපි දහ දොළොස් දෙනෙක් එකතුවෙලයි මේ "ඩිනර් ඩාන්ස්" එක සංවිධානය කරන්නෙ. "බයිලා බීට්ස් 3" වලට සංගීතය සපයන්නෙ "මිස්ට්‍රි" (Mystery) කියන "බයිලා බෑන්ඩ්" එක. එක ජූලි 20 වෙනි සෙනසුරාදා හවස 6.30 ඉඳන් උතුරු ඩැංඩිනොජ්වල මෙන්සීස් (MENZIES) ශාලාවේ මේ "ඩිනර් ඩාන්ස්" එක පැවැත්වෙනවා. ඉතින් අපි හැමෝටම ආරාධනා කරනවා අපිත් එක්ක විනෝද වෙන ගමන් මේ හොඳ කටයුත්තටත් එකතු වෙන්න කියලා....."

වැඩිදුර විස්තර ගිහාන් :0434269330* ගුන්‍යා :0451299986* සශී :0468512155* නෙත්මි :0413748836* හෝ නිපුන :0403123935* යන අයට ඇමතීමෙන් ලබාගත හැකියි.

අපි ඔවුන්ගේ උත්සාහය සාර්ථක වේවා ! යි පතමු.

# AUSTRALIAN MEDICAL STUDENTS DONATE TO KARAPITIYA TEACHING HOSPITAL

Dhoom Medical Charity is a non-for-profit university student run organization determined to make a different in the world. Dhoom Medical Charity was founded late 2012 by a group of medical students from James Cook University, Townsville. Since then Dhoom has expanded all over Australia. We are focused on celebrating the cultural diversity as well as raising money to help those in countries such as India, Sri Lanka, Pakistan, Bangladesh and Nepal. Dhoom Medical Charity is about saving lives. Good medical care is not a privilege for the wealthy. It is a right for all human beings no matter what race, creed or nationality. Dhoom Medical Charity chooses to view the world as one united and beautiful place, rather than several separate countries. We're all human and we all deserve access to health care.

Dhoom held a Baila and Hopper night in Melbourne earlier this year to raise money to buy much needed medical equipment for Karapitiya Hospital, Galle. Thanks to the great turn out we managed to raise $AU8000. We are proud to announce that the money has been used to purchase 2 multi parameter monitors and 3 infusion pumps, all of which were successfully delivered and installed in Karapitiya Hospital a few weeks ago. I recently received word from a Karapitiya Hospital representative that the equipment is in good working condition.

I would like to extend a huge, heartfelt thank you to all our sponsors, the media outlets who helped advertise and who covered the event. A huge thank you to AUSLMAT for their support, the volunteers who worked tirelessly and of course, to everyone who attended the night.

I think its important to remember that while this might seem like a small step even the smallest step can make a huge difference. The reality is it will never seem that we're doing enough. It will never seem that we're helping enough people. But that doesn't mean we stop trying.



For more information, or to get involved go to www.dhoomcharity.com

**Dinuka Dadallage**
Dhoom Medical Charity
National Vice President







